# 9. සදාකාල ජීවිතය

**ජේසුස් වහන්සේ බොහෝ වද වේදනා විඳ කුරුසිපත් වූ ආකාරයත් උන්වහන්සේ තෙදිනකින් උත්ථාන වූ බවත් ඒ පිළිබඳ ව බොහෝ දෙනා සාක්ෂි දැරූ බවත් අපි පෙර පාඩම් වලින් ඉගෙන ගතිමු.**

**උන්වහන්සේගේ උත්ථාන වීම කාරණකොටගෙන අපට හිමිවන සදාකාල ජීවිතය පිළිබඳවත් ඒ සඳහා ක්‍රියා කළ යුතු ආකාරය පිළිබඳවත් මෙම පාඩමෙන් හඳුනා ගැනීමට අපේක්ෂිත ය.**

ඉරිදා දේව මෙහෙය අවසන් වූ පසු ඉතා සතුටින් දෙමාපියන් සමග නිවසට පැමිණි අනගි, ප්‍රගීත් හා දිලිනිගේ සිත් තවත් සතුටට පත් වූයේ ආච්චි හා සීයා තම නිවසට පැමිණ සිටිනු දැකීමෙනි. ආච්චි හා සීයා සමග දොඩමළු වෙමින්, විනෝද වෙමින් කාලය ගත කළ දරුවන් එළිමහනට ගියේ වෙනදා මෙන් සීයාගේ රසවත් කතා ඇසීමට ය.

දිලිනි: සීයේ, මට අද කියලා දෙන්න 'පාපය' කියන්නේ මොකක්ද කියලා.

සීයා: 'පාපය' කියන්නේ අප දෙවියන් වහන්සේගේ කැමැත්තට පිටුපා ක්‍රියා කිරීම යි. එවිට සිදුවන්නේ අප හා දෙවියන් වහන්සේ අතර පවතින දේව සබඳතාවය දුරස් වීම යි.

ප්‍රගීත්: දේව සබඳතාවය පවත්වා ගැනීමට අවශ්‍ය මග පෙන්වීම ශුද්ධ බයිබලයේ සඳහන් වෙනවා නේද සීයේ ?

සීයා: ඔව් පුතා. අපි දෙවියන් වහන්සේට කීකරු ව ජීවත් විය යුතු යි. දේව අණ පනත් ඉටු කළ යුතු යි. උන්වහන්සේගේ කැමැත්ත ඉටු කළ යුතු යි. ඒ සියල්ල පිළිබඳ ව ශුද්ධ බයිබලය තුළින් අපට මග පෙන්වීම ලබා දෙනවා. අප දිනපතා දේව වචනය කියැවීමෙන් අපට පුළුවන් දේව කැමැත්ත නිවැරදි ව හඳුනා ගන්නට.

දිලිනිඃ ඇයි සීයේ අපගේ පාපය උදෙසා ජේසුස් වහන්සේ තම දිවි පිදුවා කියන්නේ ?

සීයාඃ ඉස්සර කාලයේ ජුදෙව් ජනතාව දෙවියන් වහන්සේට අකීකරු ව දේව අණ පනත් කඩ කරමින් පාපයට යොමු වූ විට එම පාපයෙන් නිදහස් වීමටත්, නැවත දේව සබඳතාවය ඇති කර ගැනීමටත් දෙවිඳුන්ට පූජාවන් ඔප්පු කළා. විශේෂයෙන් ම ඒ සඳහා බැටළු පැටියකු පූජා කිරීම ඔවුන්ගේ සිරිතක් වුණා. පූජා කල බැටළුවාගේ රුධිරය කරණකොට ගෙන තම පව් සෝදා හරින බවයි ඔවුන්ගේ විශ්වාසය වූයේ.

එහෙත් ජේසුස් වහන්සේ අපට ඇති ආදරය නිසා මිනිසා හා දෙවියන් වහන්සේ අතර බිඳුන සබඳතාව නැවත ගොඩ නැගීමටත් පාපයට කමාව හිමිකර දීමටත් දිවි දුන් බැටළු පෝතකයා බවට පත් වුණා. මෙලෙස ජේසුස් වහන්සේ කුරුසිය මත තම රුධිරය වගුරා සිදු කළේ අප සැමගේ පව් උදෙසා තම දිවි පුදා ඒ ලේ කරණකොට ගෙන අපගේ පව් සෝදා හැරීම යි. අපගේ පාපයට කමාව හිමි කර දීමයි. ඒ සියල්ල කරණකොට ගෙන පාපය නිසා දුබල වූ දේව සබඳතාවය නැවත ශක්තිමත් කිරීම යි.

ප්‍රගීත්ඃ අද අපි පල්ලියේ දේශනයෙන් ඉගෙන ගත්තේ ජේසුස් වහන්සේ අප උදෙසා දිවි පිදීම තුළින් පාපයේ වහල් බැම්මෙන් මිදී අපට ගැලවීමක් ලැබුණා කියලා. ඇත්තටම මට දැනුයි හරියටම තේරුණේ ජේසුස් වහන්සේ අප වෙනුවෙන් පීඩා වින්දේ රුධිරය වැගිරෙව්වේ ඇයි කියලා.

අනගිඃ ජේසුස් වහන්සේගේ දිවි පිදීම කරණකොට ගෙන අපගේ පාපයට කමාව ලැබුණා වගේ ම උන්වහන්සේ සදාතන ජීවනය උරුම වෙනවා කියලත් පල්ලියේ දේශනයේ දී කියවුණා. ඒක ඇත්ත ද සීයේ ?

සීයාඃ ඔව් දුව. කිතුනු අප පාස්කුව කියන්නේ ජේසුස් වහන්සේ මරණින් උත්ථාන වූ දවසට. ඒ දවස අපට ඉතා වැදගත්. ජේසුස් වහන්සේ මරණින් උත්ථාන වීම කරණකොට ගෙන අපට සදාකාල ජීවනයට ඇතුලුවීමේ මාර්ගය විවෘත කර දුන්නා.

දිලිනිඃ සදාතන ජීවිතය උරුම කර ගැනීමට අප කළ යුතු දේ ජේසුස් වහන්සේ අපට උගන්වා තිබෙනවා නේද සීයේ ?

සීයා: ඔව් දුව. ශුද්ධ ලියවිල්ලේ ඒ බව සඳහන් වෙනවා. ජේසුස් වහන්සේ පැවසුවේ "යමෙක් නැවත නූපන්නොත් ඔහුට දෙවියන් වහන්සේගේ රාජ්‍යය දැකගත නොහැකි'' බව යි. ඒ බව ජොහාන් සුභාරංචියේ 3:3 සඳහන් වෙනවා. ඉන් අදහස් කරන්නේ අප අපගේ වැරදි නිවැරදි කරගෙන, පව්වලින් මිදී අළුත් ජීවිතයකට හුරු විය යුතු බව යි.

ප්‍රගීත්: සීයේ...සදාකාල ජීවිතය උරුම කර ගැනීමට ජේසුස් වහන්සේ අනුව ගමන් කළ යුතු යි නේද?

සීයා: ඔව් පුතා. ජේසුස් වහන්සේ පැවසුවේ ඔබ සතු සියල්ල විකුණා දිළිඳුන්ට දන් දෙන්න. එවිට ස්වර්ගයේ ඔබට සම්පත් ඇති වන්නේ ය. එන්න, මා අනුගාමී වන්න කියලා. ඒ බව ලූක් සුභාරංචියේ 18 වන පරිච්ඡේදයේ 18 සිට 23 දක්වා කොටසින් අපට උගන්වනවා. ඉන් අදහස් කළේ අප සතු සම්පත් අපගේ පමණක් නොව අන් අයගේ ද යහපත උදෙසා කැප කළ යුතු බව යි. යමෙකුට උදව්වක් කරන්න සැම විට ම සිත යොමු කළ යුතු බව යි. එම උදව්ව දැනුමෙන්, හැකියාවෙන්, ශක්තියෙන්, කාලය දීමෙන් විය හැකියි. ඒ වගේම යහපත්, ආදරණීය ලෙන්ගතු වචනයෙන් පවා තවත් කෙනෙකුට සහනයක් වන්නට පුළුවන්. ජේසුස් වහන්සේ අසරණ ජනතාවට උදව් කළේ උන්වහන්සේගේ ආදරය, පිළිගැනීම, කාරුණික වචන, නිවැරදි ව තේරුම් ගැනීම වැනි දේ තුළින්. විශේෂයෙන් දරුවන් , රෝගීන්, වැන්දඹුවන් පව්කරුවන් ලෙස සමාජයෙන් ප්‍රතික්ෂේප කළ අය කෙරෙහි ජේසුස් වහන්සේ දැක් වූ සැලකිල්ල ආදර්ශයට ගෙන අපටත් හැකි යි කිතුනු අනුගාමිකයකු වන්නට. එසේ අනුගාමී වීමෙන් ජේසුස් වහන්සේ සමග සදාතන ජීවිතයට ඇතුළු වන්නට.

## සිතා බලමු

**ජේසුස් වහන්සේ කැපවුණේ, තම දිවි පූජා කළේ අපගේ පාපය වෙනුවෙනි.**

**ඒ නිසා අපගේ ජීවිත නිවැරදි කරගෙන පාපයෙන් මිදී ජීවත් වීම කිතුනු අපගේ වගකීම වේ.**

අප සැම විටම අන් අයට උදව් කිරීමට සූදානම් ව සිටිය යුතු වේ.

අප සතු සම්පත් පමණක් නොව අපගේ හැකියා ද කාලය මෙන්ම ප්‍රිය වචනයන් ද අපට අන් අය සමග බෙදා ගත හැකි දේවල් වේ.

කිතුනුවන් වන අපගේ ඒකායන පැතුම වන සදාකාල ජීවනයට පංගුකාරයන් වීමට අපි ද ජේසුස් වහන්සේගේ අනුගාමිකයෙක් වීමට කැප වෙමු.

**කටපාඩම් කරමු.**
**රෝම 12 : 2**

ක්‍රියාකාරකම

1. කිතුනුවන්ට ඇති විශේෂිත ම බලාපොරොත්තුව හිමි කර ගැනීමට ඔබගේ ජීවිත තුළ තිබිය යුතු යහපත් ගුණාංග 5ක් නම් කරන්න.

2. ඔබගේ පාපයට කමාව අයදිමින් කෙටි යැදුමක් ලියන්න.